**පානදුර ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව කර්මාන්ත ණයහිමි වටිනාකම රු.2,315,137 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,179,333 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් කර්මාන්ත ණයහිමි වටිනාකම රු.135,804 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර ප්‍රාග්ධන වියදමද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.176,100 ක් වටිනා C.C.T.V කැමරාව ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායක වීමේ ගිණුම පිළිවෙලින් රු.176,100 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) කෙසෙල්වත්ත පොදු වෙළඳපොල විදුලි උපාංග මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කරන ලද රු.274,250 ක මුදල පුනරාවර්තන වැය යටතේ දැක්විය යුතු වුවත් 509 වැය විෂය යටතේ ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් රු.45,540 ක් වටිනා විදුලි පංකාවක් සහ රු.16,000 ක් වටිනා UPS යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදූමට ආදායමින් දායකවීමේ ගිණුම රු.61,540 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා සැපයුම් හා උපකරණ වියදම රු.12,923,496 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.12,250,503 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සැපයුම් හා උපකරණ වියදම රු.662,993 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාලව 2016 වර්ෂයේ ගෙවා තිබූ රු.1,102,177 ක් වූ විවිධ වියදම් අදාල එක් එක් වැය ශීර්ෂවලට හර කර ණයහිමියන් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, එසේ කර නොතිබුණි.

(උ) කෙසෙල්වත්ත හා තන්තිරිමුල්ල යන උප කාර්යාලවල 2015 ජනවාරි 01 දිනට පිළිවෙලින් රු.95,074 ක හා රු.75,628 ක විදුලි උපකරණ ශේෂයක් තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂය තුළ පරිභෝජනය කර තිබූ නමුත්, ගබඩා ලෙජර්වල නිකුත් කිරීම් වශයෙන් දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විදුලි නඩත්තු වියදම් රු.170,702 ක් අඩුවෙන් හා විදුලි ගබඩා ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) කෙසෙල්වත්ත හා තන්තිරිමුල්ල යන උප කාර්යාලවල 2015 ජනවාරි 01 දිනට පිළිවෙලින් රු.2,433 ක හා රු.17,717 ක පොදු ගබඩා ශේෂයක් තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂය තුළ පරිභෝජනය කර තිබූ නමුත් ගබඩා ලෙජර්වල නිකුත් කිරීම් වශයෙන් දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදම් රු.20,150 කින් අඩුවෙන්ද පොදු ගබඩා ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

### 1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 4 කට අදාලව ගිණුම් අනුව ශේෂය රු.144,063,209 ක් වූ අතර ඒවාට අදාල උපලේඛන අනුව ශේෂය රු.70,008,816 ක් වූයෙන් රු.74,054,393 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.74,482,581 ක් වූ ගිණුම් ශේෂ 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

වර්ෂ ගණනාවක සිට අය නොවී ඉදිරියට ගෙන එමින් පැවත එන වීථි ලාම්පු ආධාර ශේෂය රු.7,437,096 ක්ද, පෙර ගෙවුම් ශේෂය රු.1,717,893 ක්ද තැන්පතු රු.1,500,000 ක්ද විය.

### 1.3.5 <u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවී මාස 06 ඉක්මවූ චෙක්පත් සඳහා ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුමේ රු.22,139 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.74,790,834 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.37,292,601 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **හිඟ ආදායම්**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.118,863,458 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

2.2.2 **වරිපනම් බදු**

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.19,596,648 ක හිඟයක් පැවති අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකරගෙන තිබුණේ රු.7,770,549 ක් හෙවත් සියයට 40 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.21,555,930 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.12,156,203 ක් හෙවත් සියයට 56 ක් පමණක් අයකරගෙන තිබුණි.

(iii) සමස්ථ හිඟ වරිපනම් බදු ශේෂයෙන් සියයට 22 ක් එනම් රු.4,738,336 ක් වසර 5 කට වඩා පැරණි ශේෂයක් විය. වරිපනම් ඒකක සංඛ්‍යාව 4678 ක් වූ අතර සමස්ථ හිඟයෙන් සියයට 42 ක් එනම් රු.8,891,510 ක් වසර 02 කට වඩා පැරණි වන අතර ඒවාට අදාල ඒකක සංඛ්‍යාව 12091 ක් විය.

2.2.3 **වෙළඳ ස්ථාන කුලී**

(i) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.4,127,084 ක හිඟයක් පැවතුණ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් අයකරගෙන තිබුණේ රු.537,697 ක් හෙවත් සියයට 13 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ ස්ථාන කුලී බිල් කිරීම රු.2,288,370 ක් වූ අතර වර්ෂයේ ඉන් රු.1,323,760 ක් හෙවත් සියයට 58 ක් පමණක් අයකරගෙන තිබුණි.

(iii) මුළු හිඟ ආදායමෙන් සියයට 16 ක් වූ වෙළඳ ස්ථාන කුලී සමස්ථ අයකිරීමේ ප්‍රගතිය සියයට 29 ක් පමණ පහල අගයක් ගෙන තිබුණි.

2.2.4 **ඉඩම් විකිණීම් මත බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට 1 ක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදල වශයෙන් රු.3,559,808 ක් ඉඩම් විකිණීම් 11 කින් 2015 වර්ෂයේදී ලබාගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු**

2014 දෙසැම්බර් 12 දිනැති අංක 1893 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් වූ නිවේදනය ප්‍රකාරව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදි කිරීම සහ ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් එහි දක්වා ඇති පරිදි ගාස්තු අය කළ යුතු වුවත් විගණනයේදී 2016 ජනවාරි 25 දින කරන ලද නියැදි භෞතික පරීක්ෂාවට අනුව පානදුර ප්‍රාදේශීය සභාවේ වාද්දුව උප කාර්යාල බල ප්‍රදේශයට පමණක් අයත් ගාස්තු අය කළ යුතු ප්‍රචාරක දැන්වීම්/නාම පවුරු 51 ක් සඳහා අදාල ගාස්තු අය කිරීමට සභාව කටයුතු නොකිරීම නිසා සභාවට සමාලෝචිත වර්ෂය තුළ නොලැබී ගිය ආදායම රු.462,570 ක් විය.

2.2.6 <u>ව්‍යාපාර බදු</u>

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.723,831 ක හිඟයක් පැවතුණ අතර ඉන් අයකරගෙන තිබුණේ රු.207,360 ක් හෙවත් සියයට 29 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.3,084,281 ක් වූ අතර ඉන් රු.1,921,771 ක් පමණක් වර්ෂය තුළදී අයකරගෙන තිබුණි.

(iii) වර්ෂය තුළදී බිල් කරන ලද ව්‍යාපාර බදු එම වර්ෂය තුළදීම අයකර ගත යුතු වුවත්, එසේ නොකිරීම හේතුවෙන් වර්ෂය අවසානයට හිඟ හිටි ව්‍යාපාර බදු රු.1,678,981 ක ශේෂයක් දක්නට ලැබුණි.

2.2.7 <u>කර්මාන්ත බදු</u>

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.224,210 ක හිඟයක් පැවතුණ අතර ඉන් අයකරගෙන තිබුණේ රු.132,610 ක් හෙවත් සියයට 59 ක් පමණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.599,460 ක් වූ අතර ඉන් වර්ෂය තුළදී රු.462,910 ක් එනම් සියයට 77 ක් පමණක් අයකරගෙන තිබුණි.

2.2.8 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 67,571,727 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 5,940,903 |
| මුද්දර ගාස්තු | 61,630,824 |

2.2.9 <u>ත්‍රී රෝද ගාල් කිරීමේ ගාස්තු</u>

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් රාශියක් දක්නට ලැබුණද එම නැවතුම්පලවලින් ගාස්තු අයකිරීම සඳහා සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නීතිගත කරවාගෙන නොතිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3:1 <u>වාහන පාලනය</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) වාහන අනතුරු 4 ක් සඳහා රක්ෂණ වන්දි ඉක්මවා සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී රු.81,339 ක වියදමක් දරා තිබුණි.

(ii) සභාව සතු වාහන අළුත්වැඩියා කිරීමේදී (විශේෂයෙන් එන්ජින් අළුත්වැඩියා) ඒ පිළිබඳව ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය අවශ්‍ය වුවද රු.535,794 ක් වූ වාහන අළුත්වැඩියා කිරීම්/ අමතර කොටස් මිලදී ගැනීම් සම්බන්ධයෙන් එලෙස ඉංජිනේරු නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(iii) සභාව විසින් විගණනය වෙත ලබාදුන් සභාවේ වාහන පිළිබඳ වූ උපලේඛණයට අනුව වාහන 06 ක් පවතින ස්ථානයක් සෙයාගත නොහැකි බැව් දක්වා තිබුණි. මෙම වාහනවල පැවැත්ම තහවුරු කරවාගැනීමට සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) සභාව සතු ට්‍රැක්ටර් රථයක් දැනට ධාවනය නොවන බවත්, ට්‍රේලර් 03 ක් සහ ට්‍රේලර්වලින් ඉවත් කළ යකඩ සැකිලි 03 ක් වාද්දුව ප්‍රධාන කාර්යාල භූමියේ දිරායමින් පවතින බවත් විගණනයට නිරීක්ෂණය විය.

3.2 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

මිය ගිය, ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය සේවකයින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු රු.187,198 ක ණය ශේෂයන් විගණිත දිනය වූ 2016 ජූනි 20 දින වන විටත් අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.3 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

(අ) මොරටුව මහ නගර සභාවේ මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කරන සේවකයින් දෙදෙනෙකු සභාවේ සේවයේ නොයෙදී කාර්යාලයේ අත්සන් ලේඛණයේ අත්සන් කර කාර්යාලයෙන් බැහැර ගොස් නැවත සවස් වරුවේ පැමිණ අත්සන් තබා යාම දෛනිකව කරගෙන යනු ලබන බවත් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ අත්සන් තබා නොමැති බවත් ඔවුන් අනුයුක්ත කර සිටින කෙසෙල්වත්ත උප කාර්යාලයේ කාර්යභාර නිලධාරී විසින් 2015 මාර්තු 11 දින සභාවේ ලේකම් වෙත ලිඛිතව වාර්තා කර තිබුණි.

මේ අතරින් 2015 පෙබරවාරි 18 දින සිට කෙසෙල්වත්ත උප කාර්යාලයට අනුයුක්ත කර ඇති රියදුරෙකු කිසිදු දිනක කාර්යාලයේ රැඳී නොසිටින අතර සභාවේ කිසිදු රාජකාරියක් ඔහුගෙන් ඉටු කර නොගන්නා බවත් ඔහුගේ වැටුප් ගෙවීම සම්බන්ධව නිර්දේශ ලබාදිය නොහැකි බවත් 2015 සැප්තැම්බර් 16 දිනැති ලිපියෙන් කාර්යභාර නිලධාරී විසින් සභාවේ ලේකම් වෙත දැනුම් දී තිබුණි.

කෙසේ වුවද එම සේවකයාට 2015 පෙබරවාරි 09 දින සිට 2015 ඔක්තෝබර්මස දක්වා රු.348,173 ක් වැටුප් හා දීමනා වශයෙන් සභාවෙන් ගෙවා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 | -- | -- |
| ද්විතීය | 59 | 53 | 01 | 07 |
| කණිෂ්ඨ | 173 | 168 | 02 | 07 |
| | 233 | 222 | 03 | 14 |

3.4 **අවිධිමත් ගනුදෙනු**

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(I) වගන්තිය අනුව කිසියම් කාර්යයක් සඳහා ලබා දිය යුතු අත්තිකාරම් මුදල මුළු ඇස්තමේන්තුවෙන් සියයට 20 ක් ඉක්ම නොවිය යුතු වුවත් එයට පටහැනිව 2015 ජූලි 27 දින ඉදිකිරීම් අධීක්ෂණ හා උපදේශක සේවා ලබාගැනීම වෙනුවෙන් ඇස්තමේන්තු මුදලින් සියයට 50 ක් එනම් රු.69,500 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසිදු ආයුර්වේද බෙහෙත් ශාලාවක් හෝ සායනයක් නොපැවතියද බුලත්සිංහල ප්‍රාදේශීය සභාව වෙත අනුයුක්ත කර සිටි ආයුර්වේද වෛද්‍යවරියක් 2015 අප්‍රේල් මස 21 දින සිට සතියට දින 03 ක් පානදුර ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කර තිබුණි.

3.5 **කොන්ත්‍රාත් පාලනය**

2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී අදාල ප්‍රජා පාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා වැඩි ප්‍රමාණයක නිරත වී නොසිටිය යුතු වුවත් එයට පටහැනිව එකම කාලසීමාවක් තුළ සමිති 02 ක් විසින් කොන්ත්‍රාත් 04 ක ප්‍රමාණයක් සිදු කර තිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වාහන පාලනය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

(ඊ) මානව සම්පත් කළමනාකරණය